# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 999 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திக / Date: 14/06/2024 පැය 0530

## මාධ්‍ය නිවේදනය

**01. නාඳුනන මළ සිරුරක් - කළුතර උතුර පොලිස් වසම.**

2024.06.13 වන දින උදෑසන කාලයේදී කළුතර උතුර පොලිස් වසමේ කුඩා වස්කඩුව වෙරළ තීරයට පිරිමි පුද්ගලයෙකුගේ මළ සිරුරක් ගොඩගසා ඇති බවට 119 තොරතුරු මධ්‍යස්ථානයෙන් ලද පණිවිඩයක් මත කළුතර උතුර පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත. මෘත ශරීරය නාගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැත.

**මරණකරු උස අඩි 05 අඟල් 02 ක් පමණ වන සිහින් සිරුරක් හෙබි තළෙළු පුද්ගලයෙකි. කොණ්ඩය අඟල් 04 ක් පමණ වැවී ඇත. උඩුකයට දුඹුරු පැහැති ටී ෂර්ට් එකක් හැඳ සිටී.**

කළුතර උතුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

2024.06.13 වන දින දහවල් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ රත්මලාන ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 330 ක් සහ අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 530 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 19 ක් සහ 43 ක් වන රත්මලාන ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - තලංගම පොලිස් ස්ථානය.**

2024.06.13 වන දින රාත්‍රී කාලයේ තලංගම පොලිස් වසමේ කලල්ගොඩ හන්දිය ආසන්නයේදී තලංගම පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 13 මිලිග්‍රෑම් 200 ක්** සන්තකයේ තබාගෙන **සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 49 ක් වන පන්නිපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තලංගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

2024.06.13 වන දින සවස් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ කවුඩාන පාලම ආසන්නයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 06 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වන බොරලැස්ගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ඇතිමලේ පොලිස් ස්ථානය.**

2024.06.13 වන දින සවස් කාලයේ ඇතිමලේ පොලිස් වසමේ උඩුවරවැව ප්‍රදේශයේදී ඇතිමලේ පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 69 ක් වන උඩුවරවැව, ඇතිමලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඇතිමලේ පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. පුරාවස්තු ලබා ගැනීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් සය දෙනෙකු අත්අඩංගුවට - විශේෂ කාර්ය බලකා කඳවුර හම්බන්තොට.**

2024.06.13 වන දින සවස් කාලයේ වීරවිල පොලිස් වසමේ සිංහපුර ප්‍රදේශයේ පොලිස් විශේෂ කාර්ය බලකා හම්බන්තොට කඳවුරේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර විහාරස්ථානයකට යාබද ඉඩමක් තුල පුරාවස්තු ලබා ගැනීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් සය දෙනෙකු කැණීම් උපකරණ හා පූජා භාණ්ඩ සමග අත්අඩංගුවට ගෙන වීරවිල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 47,50 සහ 55 යන වයස්වල පසුවන තංගල්ල, කැගල්ල, බණ්ඩාරගම, කොස්ගම හා වීරවිල යන ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

වීරවිල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. පුරාවස්තු ලබා ගැනීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - මොරගහහේන පොලිස් ස්ථානය.**

2024.06.13 වන දින රාත්‍රී කාලයේ මොරගහහේන පොලිස් වසමේ මොරොරොට්ටාවවත්ත ප්‍රදේශයේ මොරගහහේන පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර නිවසක් තුල පුරාවස්තු ලබා ගැනීමේ

අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු කැණීම් උපකරණ හා පූජා භාණ්ඩ සමග අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 27,43 සහ 53 යන වයස්වල පසුවන කඹුරුපිටිය, ගෝනපොල සහ හොරණ ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මොරගහහේන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. මාරක රිය අනතුරක් - සාම්පූර් පොලිස් වසම.

2024.06.13 වන දින උදෑසන කාලයේ සාම්පූර් පොලිස් වසමේ අතුරු මාර්ගයක් අයිනේ නිදා සිටි පුද්ගලයෙකු යම් කිසි රථයකට යටවීමෙන් මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 21 ක් වන සෙනයූර් 06, මූතූර් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු ගවයින් බලාගන්නා කටයුතු වල නිරත පුද්ගලයකු වන අතර මානසික ආබාධයකින් පෙලෙන පුද්ගලයෙකු බවට අනාවරණය වී ඇත. මෙම පුද්ගලයා නිදා සිටි මාර්ගයේ ගල් ප්‍රවාහනය කරන ටිපර් රථ සැලකිය යුතු ප්‍රමාණයක් ධාවනය වන අතර එවැනි රථයක ගැටී ඇත් ද යන්න සම්බන්ධයෙන් සාම්පූර් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**